# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/54 - 2019 ජනවාරි මස 26 වැනි සෙනසුරාදා - 2019.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* AO/MN/01/07/2014.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* 4/3/2014/D/195.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක MW/53 කඩ්ඩුකාරන් කුඩුඉරිප්පු ග්‍රාම නිළධාරී වසමේ සෙල්වරි වත්ත ගමේ පිහිටි සර්වේ ජෙනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු පත් අංක මන් 741හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.1359ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස;

මූලික පිඹුරු අංක මු.පි.කො මන් 741 හි කැබලි අංක 01

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: සෙල්වරි; වර්තමාන ඉඩම පරිහරණය : තල්ගස් වලින් සමන්විත ඉඩම; හිමිකම් පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල් හිමිකම් පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 4.1359.

ඉහත සඳහන් *ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 පෙබරවාරි මස 28 වැනි දින පෙ.ව. 10.00ට මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 පෙබරවාරි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ.සිවසම්බු,
ප්‍රාදේශීය ලේකම්,
මන්නාරම.

මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

02-393